# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 අප්‍රේල් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 මැයි මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 4.25 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2007 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 අප්‍රේල් මස 30 වන දින]

එල්.ඩී.—ඕ. 10/2007.

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65(අ) වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 262 වන අධිකාරියේ 65 (අ) වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තිය එම වගන්තියේ (2) (අ) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යෙදූ (2) (අ) උපවගන්තියේ "එම යෝජනා පත්‍රයේ නම් ඇතුළත්ව තිබූ" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන අත්හැරීමෙන් ; සහ

(3) නැවත අංක යෙදූ (2) (අ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:—

" (ආ) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා පත්‍රයක නම් සඳහන් වන සියලු අපේක්ෂකයන් තේරී පත්ව ඇති අවස්ථාවක හෝ එම නාම යෝජනා පත්‍රයේ නම් ඉතිරිව ඇති අපේක්ෂකයන්ගෙන් කිසිවකු හෝ හට මනාප කිසිවක් ලැබී නොමැති අවස්ථාවක දී සහ එම හේතුව නිසා අදාල පළාත් පාලන ආයතනයේ පුරප්පාඩුවක් ඇතිවන විට එම පුරප්පාඩුව පිරවීම සඳහා පුරප්පාඩුව පිරවීමට අදාළ දැන්වීමෙහි නිශ්චිතව දැක්වෙන කාලසීමාව ඇතුළත ආඥාපනත යටතේ සුදුසුකම් ලබන තැනැත්තකු එම පළාත් පාලන ආයතනයේ සභිකයකු

2—P L 001911-4,400 (2007/04)

ලෙස නම් කරන ලෙස නියම කරමින් ධුරය හිස්කරන ලද සභිකයාගේ නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කළ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා වෙත හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා වෙත එම කරුණ පිළිබඳව තේරීම්භාර නිලධරයා විසින් දැනුම් දිය යුතු ය. එම පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තකු නිශ්චිත කාලය ඇතුළත එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් නම් කරනු ලබන්නේ නම් සහ එම පුරප්පාඩුව පිරවීම සඳහා නාම යෝජනා කරන ලද තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රය අනුව දිවුරුමක් හෝ ප්‍රතිඥා දීමක් සිදු කර එම දිවුරුම හෝ ප්‍රතිඥාවද එම නාමයෝජනා කිරීම සමග ඉදිරිපත් කර ඇත්නම්, තේරීම්භාර නිලධරයා විසින් අදාළ පළාත් පාලන ආයතනයේ සභිකයකු ලෙස එම තැනැත්තා තෝරා පත් කර ගත් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(ඇ) අදාළ පළාත් පාලන ආයතනයේ (ආ) ඡේදයේ නිශ්චිතව දැක්වෙන ආකාරයට ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා තෝරා පත් කරගනු ලබන තැනැත්තා තම අනුප්‍රාප්තිකයා වන සභිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.